**කෝරලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව කෝරලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කෝරලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1:3:1 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වටිනාකම රු.30,629 ක් විය.

#### 1:3:2 අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති , රීති , රෙගලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1992 සැප්තැම්බර් 30 දිනැති අංක 1769 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට රු.105,823 ක් වූ සැලසුම් ඇඳීම් ගාස්තු ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 3.9.1 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට පටහැනිව රු.385,381 ක වටිනාකමකට ප්‍රජා මධ්‍යස්ථාන 4 ක සිවිල් වැඩ ප්‍රදානය කර තිබුණි. |
| (ඇ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය | රු.1,414,740 ක් වු ගෙවීම් වලින් 5% ක රඳවා ගැනම් බදු රු.70,737 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2006 අංක 12 දරන මුද්දර බදු පනත | පාර්ශ්‍රමික වලින් රු.300 ක මුදලක් අයකර ගෙන නොතිබුණි. |
| (ඉ) | මුදල් රෙගුලාසි අංක 396 | මාස 6 කට වැඩි කාලයක් ඉක්මවු රු.44,843 ක උපලබ්ධි නොවු චෙක්පත් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | මුදල් රෙගුලාසි අංක 138 | අදාල වගකිව යුතු නිලධාරියා විසින් සහතික කිරීමෙන් තොරව විවිධ කාර්යයන් සඳහා රු.14,935 ක මුදලක් ගෙවා තිබුණි. |
| (උ) | උතුරු නැගෙනහිර පළාතේ විශේෂ ගැසට් නිවේදනය, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ සංශෝධිත 184 වගන්තිය | චක්‍රලේඛයට පටහැනිව සංග්‍රහ ගාස්තු සඳහා මන්ත්‍රීවරුන්ට රු.7,620 ක මුදලක් ගෙවා තිබුණි. |
| (ඌ) | පළාත් පාලන පළාත් කොමසාරිස්ගේ අංක 1996/02 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව වත්කම් භෞතික සමීක්ෂණය සඳහා රු.1,700 ක මුදලක් සභා සාමාජිකයකුට ගෙවා තිබුණි. |
| (එ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය | ශෂ්‍යයින් සඳහා සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් රු.31,720 ක් ගෙවා තිබුණි. මේ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,953,148 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.533,341 ක් විය.

### 2:2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම, හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 2,691 | 262 | 8,862 | 1,679 | 1,688 | 6,452 |
| (ii) | බදු කුලී | 3,373 | 2,815 | 578 | 403 | 403 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 974 | 1,008 | 25 | 885 | 946 | 59 |
| (iv) | වෙනත් ආදායම් | 8,223 | 8,223 | - | 2,061 | 563 | 1,498 |

### 2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 14,610 | 11,758 | 2,852 | 9,973 | 9,460 | 513 |
| වෙනත් | 4,292 | 2,538 | 1,754 | 4,595 | 2,656 | 1,939 |
| උප එකතුව | 18,902 | 14,296 | 4,606 | 14,568 | 12,116 | 2,452 |
| මූලධන වියදම | 14,463 | 3,353 | 11,110 | 1,320 | 425 | 895 |
| මුළු එකතුව | 33,365 | 17,649 | 15,716 | 15,888 | 12,541 | 3,347 |

## 2:4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 09 | 09 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 25 | 25 |
| වෙනත් (අනියම් / තාවකාලික) | - | 19 |
| | 35 | 54 |

## 2:5 වත්කම් කළමනාකරණය

### 2:5:1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

රු.225,000 ක් වටිනාකම වූ මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ වර්ෂ 3 කට වැඩි කාලයක් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**2:5:2 ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 7 කට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂය රු.458,331 ක් විය.

**2:5:3 අයවිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 3 කට වැඩි කාලයක් ඉක්ම වූ අය විය යුතු සේවක ණය ශේෂ එකතුව රු.61,416 ක් විය.

**2:5:4 සමීක්ෂණය නොකල වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම් වල වටිනාකම රු.52,525,370 ක් විය.

**2:6 අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ආදායම් පරිපාලනය